**සමාජ විද්‍යා තරගාවලිය-2019**

**කලාප මට්ටම**

ශ්‍රේණිය - 10

කාලය පැය 02

විභාග අංකය -

පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

- අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01) ෆර්නාඩ් ඩී. ක්වෙරෝස් පියතුමා විසින් ලංකාව පිළිබඳව විස්තර ඇතුළත් කර රචනා කළ මූලාශ්‍රය අයත් වන්නේ,

i) ග්‍රීක මූලාශ්‍රය ii) චීන මූලාශ්‍රය iii) පෘතුගීසි මූලාශ්‍රය iv) රෝම මූලාශ්‍ර

02) ගල් යුගයට අයත් මානව ඇටසැකිලි 30ක් සොයාගන්නා ලද ස්ථානයක් වන්නේ

i) කිතුල්ගල බෙලිලෙන ii) බෙල්ලන්බැඳි පැලැස්ස

iii)පාහියංගල ලෙන iv) බටදොඹලෙන

03) උඩරංචාමඩමේ කැණීම්වලින් සකපෝරුව භාවිතා කර තැනූ මැටි බඳුනක කැබලි හමුවූ අතර, ඒ හා සමාන බඳුනක කොටස් හමු වූ තවත් ස්ථානයක් වන්නේ,

i) බෙරගල ii) ඉබ්බන්කටුව iii) මිනිහාගල්කන්ද iv) හල්දූම්මුල්ල

04) ජෛව ගෝලයේ පැවැත්මට ඉතා වැදගත්වන ඕසෝන් ස්තරය පිහිටා ඇත්තේ,

i) පරිවර්ති ගෝලයේ ය. ii) අපරිවර්ති ගෝලයේ ය.

iii)මෙසෝ ගෝලයේ ය. iv) තාප ගෝලයේ ය.

05) "ප්‍රජාතන්ත්‍රවාදය යනු සියලුදෙනාටම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයකි" මේ අදහස ඉදිරිපත් කලේ,

i) එබ්‍රහම් ලින්කන් ය. ii) සීලර් ය.

iii)ජී.ඩී.එච්. කෝල් ය. iv) මහාචාර්ය අයිවර් ජෙනිංගස් ය.

06) "පොවනි රජ" යනුවෙන් හැඳින් වූ ප්‍රාදේශික පාලකයෙකු ගැන සඳහන් වන සෙල්ලිපිය වන්නේ,

i) කෑගල්ලේ යටහලෙන ii) මාතලේ ඇඹුල්අඹේ

iii)සිතුල්පව්ව කොරවක්ගල iv) කොත්ගල්කන්ද

07) "චක්‍රවර්තී ස්වාමීන් වහන්සේ" ලෙස තමන්ව හඳුන්වා ගත් රජු වන්නේ,

i) වසභ ii) I කාශ්‍යප iii) IV උදය iv) නිශ්ශංකමල්ල

08) ලෝකයේ පියස්ස නමින් හැඳින්වෙන සානුව වන්නේ,

i) ටිබෙට් සානුව ii) පාමීර් සානුව

iii)මොංගෝලියානු සානුව iv) ඩෙකෑන් සානුව

09) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කොපමණ වාර ගණනක් සංශෝධනය වී ඇත්ද?

i) 20 කි. ii) 18 කි.. iii) 19 කි. iv) 17 කි.

10) මෙවර ICC ලෝක කුසලානය පැවැත්වෙන්නේ කී වෙනි වරට ද?

i) 11 ii) 3 iii) 12 iv) 13

- 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර තිත් ඉරමත ලියන්න.

11) බ්‍රිතාන්‍යයේ නාමික විධායකය ලෙස සැලකෙන්නේ ........................................................ යි. එය සම්ප්‍රදායක් ලෙස පැවතෙන්නකි.

12) ලෝකයේ දේශගුණික ව්‍යාප්තිය පිළිබඳව මුලින්ම අදහසක් ඉදිරිපත් කරනු ලැබුවේ, ක්‍රි.පූ. 384 දී පමණ ........................................................ දාර්ශනිකයෙකු වන ඇරිස්ටෝටල් විසිනි

13) වසභ රජතුමාගේ පාලන සමයේ නාගදීපය පාලනය කළ සෘෂිගිරි නම් ඇමතියා ........................................................ විහාරය ඉදි කර ඇත.

14) අරාබි ජාතික ඉතිහාසඥයෙකු වූ ........................................................ සඳහන් කරන අන්දමට එසමයෙහි රතුකැට දිවයින ලෙස හැඳින්වූයේ ශ්‍රී ලංකාවයි.

15) මෑතකදී ලාංකීය ඉංජිනේරුවන් විසින් .................................... චන්ද්‍රිකාව කක්ෂගත කරන ලදී.

- 16 සිට 25 දක්වා කෙටි පිළිතුරු සපයන්න.

16) අපරාධකරුවන් අල්ලාගන්නාතුරු ඔහු ජීවත් වූ ගමේ වැසියන් විසින් රජයට ගෙවිය යුතු බද්ද කුමක්ද? ........................................................................................

17) වායුගෝලයේ අඩංගු නයිට්‍රජන් වායු ප්‍රතිශතය නිවැරදිව ලියන්න. .....................

18) සොරකම් කිරීම, මිනීමැරීම ආදී වරදවල් සඳහා දිය යුතු දඬුවම් විස්තර කර ඇති සෙල්ලිපිය කුමක්ද? ........................................................................................


19) ශ්‍රී ලාංකිකයන්ට සර්වජන ඡන්ද බලය ලැබුණු ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ කුමක්ද?

........................................................................................

20) රැම්සා සම්මුතියට අනුව ලෝකයේ එකම තෙත්බිම් නගරය කුමක්ද?

........................................................................................

- 21 සිට 25 දක්වා ප්‍රශ්නවලට අදාල රූපසටහන් ඇසුරෙන් පිළිතුරු ලියන්න.

21) 

i) මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

.................................................

ii) මෙම උපකරණ සොයාගෙන ඇත්තේ කුමන ස්ථානයක් කැණීමෙන්ද?

.................................................

22) 

i) මෙම රූපය කුමක්ද?

.................................................

ii) මෙය සොයාගෙන ඇත්තේ කුමන නගරයකින්ද?

.................................................

23) 

i) මෙම සිතියම නිර්මාණය කිරීමට යොදාගත් ද්‍රව්‍යය කුමක්ද?

.................................................

ii) මෙය අඳින ලද්දේ කුමන ජාතිකයෙකු විසින්ද?

.................................................


24) 

i) මෙම පුද්ගලයා කවුද?

.................................................

ii) මොහු කවර රටක වාසය කලේද?

.................................................

25) 

i) මෙම රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?

.................................................

ii) මෙය පිහිටා ඇති නගරය කුමක්ද?

.................................................

- 26 සිට 30 දක්වා දී ඇති ප්‍රශ්නවලට "අ" හා "ආ" ලෙස තීරු 2ක් දැක්වේ. ඒවා සම්බන්ධතාවය අනුව ගැලපෙන නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

26) පහත මූලාශ්‍ර රචනා කළ පුද්ගලයන් ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ

| "අ" | "ආ" |
|---|---|
| 1. ඇරිස්ටෝටල් | A එදාහෙළ දිව |
| 2. මෙගස්තිනිස් | B නැචුරාලිස් හිස්ටෝරියා |
| 3. ප්ලිනි | C ඩිමුන්ඩෝ |
| 4. රොබට් නොක්ස් | D ඉන්ඩිකා |

i) CBDA ii) ABCD iii) CDBA iv) ABDC

27) පහත රාජ්‍යත්ව සංකල්ප රජතුමා සමග නිවැරදිව ගැලපූවිට දැක්වෙන පිළිතුර කුමක්ද?

| "අ" | "ආ" |
|---|---|
| 1. නරඉසෙර | A I කාශ්‍යප රජු |
| 2. පර්වතරාජ | B සිරිසඟබෝ රජු |
| 3. බෝධිසත්ව | C මහසෙන් රජු |
| 4. දේවත්ව | D කුටකණ්ණ අභය රජු |

i) BACD ii) DABC iii) CDAB iv) ABCD

28) විශාලත්වය අනුව මහාද්වීප ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| "අ" | "ආ" |
|---|---|
| 1. උතුරු ඇමෙරිකා මහාද්වීප | A 29.5% |
| 2. අප්‍රිකා මහාද්වීපය | B 16.4% |
| 3. ආසියානු මහාද්වීපය | C 12.0% |
| 4. දකුණු ඇමෙරිකා මහාද්වීපය | D 20.4% |

i) BADC ii) BDAC iii) DABC iv) ACBD

29) පහත සඳහන් ගංගාවන් ආරම්භවන ස්ථාන නිවැරදිව ගැලපූ විට පිළිතුර වන්නේ,

| "අ" | "ආ" |
|---|---|
| 1. තේම්ස් ගඟ | A කඳුකර උල්පතකින් |
| 2. නයිල් ගඟ | B උල්පතකින් |
| 3. රයින් ගඟ | C විලකින් |
| 4. මහවැලි ගඟ | D ග්ලැසියර දිය වූ ජලය |

i) ADBC ii) CABD iii) DABC iv) BCDA

30) පහත රාජ්‍ය නිළධාරීන් සෙල්ලිපිවල සඳහන්වන ආකාරය නිවැරදිව ගැලපූ විට,

| "අ" | "ආ" |
|---|---|
| 1. කනපෙඩික | A නාට්‍ය අංශ ප්‍රධානී |
| 2. රූප අදෙක | B චත්සිරිත් චාරිත්‍ර අධිකාරී |
| 3. කොතුරු ගෑනා | C කාසි අච්චු ගැසීමේ අංශ ප්‍රධානී |
| 4. නට අදෙක | D රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානී |

i) DCBA ii) BCAD iii) DABC iv) BDAC



CS CamScanner

- 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

31) i) ග්‍රීසියේ පෞර රාජ්‍යයේ පැවති පාලන ක්‍රමය කුමක්ද?

..............................................................................................................

ii) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්ද?

..............................................................................................................

iii) සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී ඇතිවන ගැටලු 3ක් ලියන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

32) i) ජෛව ගෝලය යනු කුමක්ද?

..............................................................................................................

ii) ජෛව ගෝලයේ ක්‍රියාකාරීත්වයට බලපාන සාධක 2ක් ලියන්න.

..................................................... .....................................................

iii) ජෛව ගෝලයේ සමතුලිතතාවය බිඳවැටීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් 3ක් ලියන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

33) i) ප්‍රථමවරට තුන්සිංහලය එක්සේසත් කළ රජතුමා කවුද?

..............................................................................................................

ii) එම රජු ඉදිකළ ගොඩනැඟිලි නිර්මාණ 2ක් ලියන්න.

..............................................................................................................

..............................................................................................................

iii) මෙතුමා ලංකා ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ රජකු බව දැක්වීමට හේතු 3ක් ලියන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................

34) i) ශ්‍රී ලංකාවේ කෘෂි තාක්ෂණික උයන පිහිටියේ කොහේද?

..............................................................................................................

ii) ශ්‍රී ලංකාවේ අඩුම හා වැඩිම බිම් ප්‍රමාණයක් වී වගා කරන දිස්ත්‍රික්ක 2ක නම් කරන්න.

..................................................... .....................................................

iii) වී වගාව කෙරෙහි බලපාන භෞතික සාධක 3ක් ලියන්න.

..............................................................................................................

..............................................................................................................

..............................................................................................................



CamScanner

35) i) සමස්ත ගෝලීය ජල ප්‍රමාණයෙන් මිනිසාට භාවිතයට ගත හැකි මතුපිට මිරිදිය ජල ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස කොපමණද? ..........................................................................

ii) පෘථිවියේ ජලය ව්‍යාප්තව පවතින ආකාර 2ක් ලියන්න.

..........................................................................................................

..........................................................................................................

iii)ජලයේ ගුණාත්මකභාවය අඩුවීමට බලපාන මිනිස් ක්‍රියාකාරකම් 3ක් ලියන්න.


..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

- අංක 36 සිට 45 දක්වා දී ඇති ස්ථාන ශ්‍රී ලංකා සිතියමේ ලකුණු කර දක්වන්න.

| | |
|---|---|
| 1) කුඹුක්කන් ඔය | 6) මඩකලපුව |
| 2) දඹකොළ පටුන | 7) සේනානායක සමුද්‍රය |
| 3) ෆෙඩ්රික් කොටුව | 8) දේවනගරය |
| 4) නච්චදූව වැව | 9) තංගල්ල |
| 5) පොම්පරිප්පු | 10)සෙංකඩගල |





LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න